මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :LAE/2025/87

2025.05.03

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2025.04.25 දිනැති අංක LAE/2025/71 හා LAE/2025/72 දරන මාධ්‍ය නිවේදන කෙරෙහි නැවතත් අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයන් කටයුතු කළ යුතු බවට පළාත් පලාන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) 84අ වගන්තිය අනුව විධිවිධාන සලසා ඇති අතර 2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පලාන ආයතන ඡන්ද විමසීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

මේ සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් සියලුම සේවා යෝජකයින් දැනුවත් කර ඇතත් සමහර බැංකුවල සේවකයන්ට නිවාඩු ලබාදීම නිසි පරිදි සිදු නොවන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී තිබේ.

ඒ අනුව සියළුම රාජ්‍ය හා පෞද්ගලික බැංකුවල සේවයේ නියුතු ස්වකීය කාර්ය මණ්ඩලයට මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන පරිදි නිවාඩු ලබා දීමට ක්‍රියා කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්